# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,156 - 2019 දෙසැම්බර් මස 27 වැනි සිකුරාදා - 2019.12.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 856 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.*- (i) විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2019 දෙසැම්බර් මස 13 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2019 දෙසැම්බර් මස 13 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) මුස්ලිම් විවාහ හා දික්කසාද (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත 2019 දෙසැම්බර් මස 13 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2020 ජනවාරි මස 17 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 ජනවාරි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

බස්නාහිර පළාත්බද වාණිජ මහාධිකරණයේ දී ය

කොළඹ 02 හයිඩ්පාක් කෝනර්, අංක 97, පෙර කොළඹ 01, ජනාධිපති මාවතේ, අංක 69, සෙලින්කෝ මන්දිරයේ, 3 වන මහලේ පිහිටි සීමාසහිත ද ෆිනෑන්ස් සමාගම, ද ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්

......................*පැමිණිලිකරු.*

වාණිජ මහාධිකරණ
නඩු අංකය : CHC 498/2016 MR.
ඇස්කිසී අංකය : 48/2018

*එදිරිව*

(1) මීගමුව, කිඹුලාපිටිය, අංක 414 හි සහ දැනට ඉතාලියේ පදිංචි වර්ණකුලසූරිය දිනේෂ් ඇන්ටන් ගිහාන් ප්‍රනාන්දු සිය නීත්‍යානුකූල ඇටෝර්නි බලකරු වන මීගමුව, කිඹුලාපිටිය, අංක 414 හි පදිංචි වර්ණකුලසූරිය සිල්වෙස්ටර් ප්‍රනාන්දු මගින් පෙනී සිටිමින්,

(2) මීගමුව, කිඹුලාපිටිය, අංක 414 හි පදිංචි වර්ණකුලසූරිය සිල්වෙස්ටර් ප්‍රනාන්දු

*නව ලිපිනය* : අංක 283/බී/4, ගල්මුකලාන වත්ත, බටේපොල, දූනගහ.

......................*විත්තිකරු.*

ඉහත නම් සඳහන් විත්තිකරු වෙත ය.

වර්ෂ 2017.10.17 වැනි දින ඇතුළත් කර ඇති තීන්දු ප්‍රකාශය ඉහත නම් කර ඇති විත්තිකරු විසින් පැමිණිලිකරුට රුපියල් හතලිස්පන් ලක්ෂ අසූපන් දහස් පනහයි ශත දාහතක් (රු. 4,585,050.17) ක මුදලක් විත්තිකරුවන් ගෙන් අයකර ගත හැකි බවටත් එතැන් සිට එකී මුදල සම්පූර්ණයෙන් අයකර ගන්නා තෙක් නෛතික පොලිය පමණක් ලබා ගැනීමටත්, නඩු ගාස්තු ද ඒ සඳහා තවදුරටත් පොලිය හා ගාස්තු අයකර ගැනීමට ආඥා කොට ඇති බැවින් ද,

එසේම විත්තිකරු විසින් ඉහත කී රු. 4,585,050 ක මුදල ගෙවීම පැහැර හැර ඇති බැවින් එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කීසියේ බලය පිට ඉහත නම සඳහන් විත්තිකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපලෙහි හිමිකම් අයිතිවාසිකම් හා ඊට අද ාල සෑම සියලු දේ ප්‍රසිද්ධ නොතාරිස් තුෂාරි කේ. වීරසිංහ විසින් වර්ෂ 2008.06.17 වන දින, ද ෆිනෑස් සමාගම වෙත ලියා සහතික කර ඇති අංක 926 දරන උකස්කරයට හා කොළඹ වාණිජ මහාධිකරණයේ අතිරේක රෙජිස්ට්‍රාර්/අතිරේක නියෝජ්‍ය පිස්කල් විසින් වර්ෂ 2018 ක් වූ දෙසැම්බර් මස 05 වන දින කර ඇති තහනමට යටත්ව වර්ෂ 2020 ක් වූ ජනවාරි මස 30 වන දින ප.ව. 2.00 ට (ප. ව. 2.00 ට) එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණු ලබන බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

*දේපලට පිවිසීම.*- කොළඹ හලාවත මාර්ගයේ මීගමුව නගරයේ සිට කිඹුලාපිටිය පාරේ කි. මී. 6ක් පමණ ඉදිරියට ගියපසු මෙම වරිපනම් අංක 414 දරන නිවස සහිත ඉඩම ප්‍රධාන පාරේ වම්පස පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- එකී වෙන්දේසියේ දී ඉහලම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් මුලු ගැණුම් මිලෙන් 25% ක මුදලක් ද, රජයට අයවිය යුතු ගාස්තු, (පවුන්ඩජ් ගාස්තු) තක්සේරු ගාස්තු, වෙන්දේසි ගාස්තු *ගැසට් පත්‍රයේ* ගාස්තු සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් ද, අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වියදම් ද එවෙලේම මුදලින් මා වෙත ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් 75% ක ඉතිරි මුදල දින 30 ක් ඇතුළත බස්නාහිර පළාත්බඳ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් අලුත්කුරු කෝරළේ, දූනගහපත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා සීමාවේ, කිඹුලාපිටිය ගමේ, අංක 92 ග්‍රාමසේවක වසමේ පිහිටි දෙල්ගහවත්ත සහ කොන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. ඒ කොස්තා විසින් වර්ෂ 1990.07.02 වන දින මැන සාදන ලද අංක 3566 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 දරන කොටසට මායිම් උතුරට : පිට ඇල ද, නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට : මහා මාර්ගය සහ බස්නාහිරට :

ක්‍රිස්තෝම්බු ප්‍රනාන්දුගේ උරුමකාරයන්ට අයත් ඉඩමට මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් විසි අටයි දශම හතක් (අ. 0, රූ.0, පර්. 28.7) ක් විශාල ඉඩම සහ ඒ තුල පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ආදී සියලු දේ ද සමග වේ. මෙම ඉඩම මීගමුව ඉඩම ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක E 666/8 හි ලියාපදිංචි කර ඇත.

රෙජිස්ට්‍රාර් නියෝජ්‍ය පිස්කල්,
බස්නාහිර පළාත්බඳ වාණිජ මහාධිකරණය.

වර්ෂ 2019 ක් වූ දෙසැම්බර් මස 18 වැනි දින,
බස්නාහිර පළාත්බඳ වාණිජ මහාධිකරණයේ දී ය.

12-980

---

## හිඟුරක්ගොඩ දිසා අධිකරණයේ දී ය

කැළණිය, වෙදමුල්ල, නුවර පාර, අංක 933 හි ප්‍රධාන කාර්යාලය පිහිටි හිඟුරක්ගොඩ ශාඛා කාර්යාලයක් පිහිටි ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

නඩු අංකය : 12/MB/14.
ස්වභාවය : උකස් බැඳුම්කරය
වටිනාකම : රු. 4,679,111.50

*..........................පැමිණිලිකරු.*

*එදිරිව*

දේවනාරායන ආචාරිගේ ජයන්ත ප්‍රියලාල්,
අංක 18, අත්කම් නිවාස,
සී. ඩබ්ලිව් හංදිය,
හිඟුරක්ගොඩ.

*.............................විත්තිකරු.*

හිඟුරක්ගොඩ දිසා අධිකරණයේ පැවති ඉහත අංක දරන නඩුව සඳහා වර්ෂ 2017 ක් වූ අප්‍රේල් මස 06වන දිනැති නියෝගය අනුව හිඟුරක්ගොඩ දිසා අධිකරණය මගින් තහනමට ගෙන ඇති විකිණීමේ ඇස්කිසියේ බලය මත රුපියල් ලක්ෂ හැටක (රු. 6,000,000) ණය මුලින් මෙතෙක් පැමිණිලිකාර ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත ගෙවන ලද මුදල අඩු කිරීමෙන් පසුව රුපියල් 4,679,111.50 ක මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර ඒ අනුව එකී ණය මුදලේ ශේෂය මත වර්ෂ 2017.04.06 දින සිට සම්පූර්ණ මුදල ගෙවා අවසන් කරන තෙක් වර්ෂයකට 20% පොළී මුදලක්ද ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ සඳහන් සමස්ථ මුදල මත එකී මුදල පැමිණිලිකාර ආයතනයට සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තුරු නෛතික පොලිය සහ නඩු ගාස්තු අයකරවා ගැනීම සඳහා එකී පැමිණිලිකරුට හිමි මෙහි පහත උපලේඛනයේ දක්වෙන දේපළ වර්ෂ 2020 ක් වූ ජනවාරි මස 30 වන දින පෙ.ව. 11.00 ට පහත උපලේඛනයෙහි සඳහන් දේපළ පිහිටා ඇති ස්ථානයේ දී විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**පිස්කල් තැන විසින් තහනමට ගත් දේපළ සහ ඒවායේ වටිනාකම :**

### උපලේඛනය

උතුරු මැද පළාතේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ සිංහල පත්තුවේ, හිඟුරක්ගොඩ නමැති ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් තැනවිසින් සාදවා තමා බාරයේ තබා ඇති 02 වන ක්ෂේත්‍ර පත්‍රයෙහි අයි. එස්. පී. පී. 07 වැනි පිඹුරේ අංක 02 දරන අතිරේකයේ 473 දරන බිම් කැබැල්ල වශයෙන් දක්වා ඇති ප්‍රමාණයෙන් පර්චස් දෙකකුත් පර්චස් එකකින් සියයෙන් පනස් හතක් (පර්චස් 02.57) විශාල හිඟුරක්ගොඩ බැසාර් නැමති රජයේ ඉඩම් කැබැල්ල සඳහා සීමාවන්.

| | | |
|---|---|---|
| උතුරට | - | අංක 472 දරන බිම් කට්ටිය |
| නැගෙනහිරට | - | ප්‍රසිද්ධ මාර්ගය සඳහා වූ බිම ද |
| දකුණට | - | අංක 474 දරන බිම් කට්ටිය |
| බටහිරට | - | පාර සහ රක්ෂිත බිම සහ මායිම් තුල පිහිටි ඉඩම සහ එහි පිහිටි සියලු දේ ද වේ. |

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් තැන
දිසා මහේස්ත්‍රාත් අධිකරණය - හිඟුරක්ගොඩ.

12-981

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.